# අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති




## මාර්ගෝපදේශක ප්‍රතිපත්ති සඳහා පෙරවදන
## මානව හිතවාදී කටයුතු සම්බන්ධ නියෝජ්‍ය මහ ලේකම්
## - සර්ජියෝ වියෙරා ඩි මෙලෝ -

ලෝකය පුරා සිටින මිලියන 20 කට වැඩි ජනතාවකට බලපාන අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ අර්බුදය සම්බන්ධයෙන් මානව හිතවාදී ප්‍රජාවගේ අවධානය වර්ධනය වෙමින් පවතියි. අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව සැපයීමේ වගකීම මූලික සහ ප්‍රධාන වශයෙන් ජාතික ආණ්ඩුවලට හා ප්‍රාදේශීය පරිපාලනයට පැවරෙන අතර, ගැටළු සහගත සහ අර්බුදකාරී තත්ත්වයට මුහුණ පා සිටින අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වන පුද්ගලයින්ගේ ආරක්ෂාව වර්ධනය කිරීමට කොපමණ ප්‍රශස්ථ ලෙස සහාය විය හැකිදැයි සොයා බැලීම ජාත්‍යන්තර ප්‍රජාවට වැදගත් වේ. එමෙන්ම මානව හිමිකම් සඳහා සහාය වීමේ ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේදී අප එවා සැලසුම් කළ යුත්තේ එමගින්, අභ්‍යන්තර අවතැන්වීම් වලට ලක්වන පුද්ගලයන්ගේ ආරක්ෂාව වර්ධනය වන පරිද්දෙනි.

අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයින්ගේ අවශ්‍යතාවන්ට ඵලදායි හා කාලීන ප්‍රතිචාරයක් දක්වමින්, ඉතා වැදගත් පියවර ගණනාවක් එක්සත් ජාතීන්ගේ ක්‍රම පද්ධතිය තුළ ගනු ලැබ ඇත. අන්තර් - ආයතනික ක්‍රියාකාරී කමිටුව (අආක්‍රික) විසින්, අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූවන්ට අදාල ප්‍රශ්න සම්බන්ධයෙන්, එක්සත් ජාතීන්ගේ ක්‍රම පද්ධතිය තුළ කේන්ද්‍රිය පුද්ගලයා ලෙස කටයුතු කිරීමේ වගකීම මා වෙත පවරා ඇත. මේ බලය අනුව කටයුතු කිරීමේදී, අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයන්ගේ තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය සමස්ථයක් ලෙස ගෙන එහි තත්ත්වය වර්ධනය කිරීමටත්, ශක්තිමත් සම්බන්ධීකරණයක් වර්ධනය කිරීමටත්, ආයතනික වගකීම් පැහැදිලි ලෙසම බෙදා දැක්වීමට සහ ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට ප්‍රමාණාත්මක සහායක් දීමටත් මා බැඳී ඇත.

මේ සංදර්භයට අනුව, අභ්‍යන්තර අවතැන්වූවන්ගේ, මහලේකම්වරයාගේ විශේෂ නියෝජිතවරයා විසින් කරන ලද "අභ්‍යන්තර අවතැන්වීම් සම්බන්ධ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති" ප්‍රකාශනය මම සතුටින් පිළිගනිමි. දැනට පවතින ජාත්‍යාන්තර මානව හිතවාදී නීති හා මානව අයිතිවාසිකම් ප්‍රපංචයන් මත පදනම් වූ මේ මූලධර්ම, අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව හා සහාය සපයන, ආණ්ඩුවලට, ජාත්‍යාන්තර මානව හිතවාදී සංවිධානවලට සහ සංවර්ධන ආයතනයන්ට ජාත්‍යන්තර මට්ටමේ මාර්ගෝපදේශකත්වය සපයනු ඇත.

අන්තර් ආයතනික ක්‍රියාකාරී කමිටුව (අආක්‍රික) මෙම මාර්ගෝපදේශක ප්‍රතිපත්තිවලට සම්පූර්ණ සහයෝගය පළ කරයි, එමෙන්ම එහි සාමාජිකයන්ට, ඔවුන්ගේ විධායක මණ්ඩල සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල, විශේෂයෙන්ම ක්ෂේත්‍රයේ කටයුතු කරන කාර්ය මණ්ඩලවලට අභ්‍යන්තර අවතැන්වීම්වලට ගොදුරු වූ පුද්ගලයන් වෙනුවෙන් ඔවුන් කරන කටයුතුවලදී මෙම ප්‍රතිපත්ති අදාළ කර ගැනීම සහතික කෙරෙනු සඳහා මෙම ප්‍රතිපත්ති භාවිතා කිරීම දිරිමත් කරවයි.

අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූවන්ගේ අවශ්‍යතා පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමේදී වැදගත් කාර්යභාරයක් මේ මාර්ගෝපදේශක ප්‍රතිපත්තිවලට ඉටුකළ හැකියැයි මම විශ්වාස කරමි. මානව හිතවාදී ප්‍රජාව තුළ සහයෝගය ඒකරාශී කරමින්, අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූවන්ගේ සහාය හා ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා ගැටෙන විට ඒවාට විසඳුම් සෙවීමට ක්ෂේත්‍රයන්හි වැඩකරන සහායකයින්ට මේ ප්‍රතිපත්ති මහෝපකාරී වනු ඇත. මේ ප්‍රතිපත්ති ඔවුන්ගේ අවතැන්වූ ජනතාවගේ ආරක්ෂාව හා සුභසිද්ධිය සැලසීමට ආණ්ඩුවලට උපකාරී වනු ඇත.

අභ්‍යන්තර අවතැන්වූවන්ගේ තත්ත්වය වර්ධනය කිරීමේ දැඩි වුවමනාව ජයගැනීම සඳහා මේ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති ප්‍රචලිත කිරීමට හා පුළුල් අයුරින් භාවිතා කිරීමට ඔබ සියලු දෙනාම කටයුතු කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.



# අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති

## හැඳින්වීම - අවකාශය සහ අරමුණ

1. මේ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති ලොව පුරා සිටින අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කරයි. ඒවා අවතැන් කිරීමට බලකරනු ලැබූවා වූ පුද්ගලයන්ගේ ආරක්ෂාව සහතික කරන අතර, ඔවුන්ගේ අයිතිවාසිකම් හඳුනාගනියි. එමෙන්ම අවතැන් වූ කාලපරිච්ඡේදය තුළදී මෙන්ම නැවත පදිංචිය හා නැවත එක්වීම සිදුවන තුරු ඔවුන්ගේ අයිතිවාසිකම් කවරේදැයි හඳුනා ගනියි.

2. මෙම ප්‍රතිපත්තිවල පෙන්වා දෙන පරිදි, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් වූ කලී සිය නිජ වාසභූමි හෝ සිය නිවෙස් හැරදා යන්නට බලකරනු ලැබූ හෝ එසේ පලායන්නට සිදුවූ පුද්ගලයන්ගේ හෝ පුද්ගල කණ්ඩායම්වලින් සමන්විත වූ අයයි. විශේෂයෙන්ම, සන්නද්ධ අරගලවල බලපෑම් මගහැරීම සඳහා හෝ, පොදුවේ ඇති හිංසාකාරී තත්ත්වයන් නිසා හෝ, මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම නිසා හෝ ස්වාභාවිකව හෝ මිනිසා විසින් ඇතිකරන ලද විනාශයන් නිසා හෝ අවතැන් වූවන්, අවතැන්වූ පුද්ගලයන් ලෙස සැලකේ.

3. මෙම මූලධර්ම, ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය සහ ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය පිළිබිඹු කරන අතර ඒවාට අනුරූප වෙයි. ඒවා පහත සඳහන් අයට මඟපෙන්වීම් කරයි:

(අ) අභ්‍යන්තර අවතැන්වීම්වලට ගොදුරු වූ පුද්ගලයින් වෙනුවෙන් සිය බලය ක්‍රියාත්මක කිරීමේදී මහලේකම්වරයාගේ නියෝජිතයාට,

(ආ) අභ්‍යන්තර අවතැන්වීමේ සිද්ධීන්ට මුහුණ දෙන රාජ්‍යයන්ට,

(ඇ) අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයින් සමඟ සබඳතා දක්වන අනෙකුත් සියලුම අධිකාරී ආයතනවලට, කණ්ඩායම්වලට හා පුද්ගලයින්ට සහ

(ඈ) අභ්‍යන්තර අවතැන්වීම් පිළිබඳ කටයුතු කරන අන්තර් රාජ්‍ය සහ රාජ්‍යනොවන සංවිධානවලට

4. මේ මාර්ගෝපදේශක ප්‍රතිපත්ති හැකිතාක් දුරට පතළ කිරීමට හා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

## කොටස I - සාමාන්‍ය ප්‍රතිපත්ති

### -ප්‍රතිපත්ති 1-

1. අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයෝ සිය රටෙහි අනෙකුත් සාමාන්‍ය පුද්ගලයින්, ජාත්‍යන්තර සහ දේශීය නීති යටතේ භුක්ති විඳින අයිතිවාසිකම් හා නිදහස, සපුරා සමාන ලෙසින් භුක්ති විඳිනු ලබති. ඔවුන් අභ්‍යන්තර වශයෙන් අවතැන්වීමේ හේතුව නිසා ඔවුන්ට ලැබිය යුතු කිසිදු අයිතියක් හෝ නිදහසක් භුක්ති විඳීමේ ඇති අයිතිය වෙනස් කරනු නොලැබිය යුත්තේ ය.

2. මේ ප්‍රතිපත්ති, විශේෂයෙන්ම සමූලඝාතනවලට, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ හා යුද අපරාධවලට සම්බන්ධ ජාත්‍යන්තර නීති යටතේ ගැනෙන තේවල අපරාධ වගකීම්වලට අගතියක් කරන්නේ නැත.

### -ප්‍රතිපත්ති 2-

1. කිසිදු පයුගාමී බලපෑමකින් තොරව, ඔවුන්ගේ නෛතික තත්ත්වය සැලකිල්ලට නොගෙන සියළුම අධිකාරී ආයතනවලට, කණ්ඩායම්වලට හා පුද්ගලයින්ට මේ ප්‍රතිපත්ති පිළිපැදීමට පුළුවන. මේ ප්‍රතිපත්ති පිළිපැදීමෙන්, එයට සම්බන්ධ වන අධිකාරී ආයතනවල, කණ්ඩායම්වල හා පුද්ගලයින්ගේ නෛතික තත්ත්වයට කිසිදු බලපෑමක් සිදු නොවේ.

2. මෙම ප්‍රතිපත්ති, කිසිදු ජාත්‍යන්තර මානව හිමිකමකට හෝ ජාත්‍යන්තර මානව හිතවාදී නීති ආයතනයකට හෝ දේශීය නීතිය යටතේ පුද්ගලයින්ට ප්‍රදානය කරන ලද අයිතියකට, සීමා පැනවීමෙන්, අවහිර කිරීමෙන්, බාධා නොකරයි. විශේෂයෙන්ම, මෙම ප්‍රතිපත්ති අනෙකුත් රටවල සරණාගත අයිතිය ලැබීමේ හා සරණාගත අයිතිය භුක්ති විඳීමට ඇති අයිතියට අගතියක් කරනු නොලැබේ.

### -ප්‍රතිපත්ති 3-

1. සිය නෛතික බලප්‍රදේශය තුළ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින්ට ආරක්ෂාව සැපයීමේ හා මානව හිතවාදී ලෙස සහාය දීමේ මූලික වගකීම හා යුතුකම ජාතික ආණ්ඩුවලට පැවරෙයි.



2. මෙම බලධාරීන්ගෙන් ආරක්ෂාව සහ මානවහිතවාදී සහාය ඉල්ලා සිටීමටත්, එසේ සහයෝගය ලැබීමටත් අයිතිය අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින්ට තිබේ. එබඳු ඉල්ලීමක් කිරීම නිසා ඔවුන් හිංසා පීඩා කිරීමට හෝ දඬුවම් කිරීමකට ලක් නොකළ යුතුය.

### -ප්‍රතිපත්ති 4-

1. මෙම ප්‍රතිපත්ති කිසිදු ආකාරයේ විෂම ලෙස සැලකීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතුය. එනම්, ජාතිය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම හෝ විශ්වාසය, දේශපාලන හෝ අනෙකුත් අදහස්, ජාතික, වාර්ගික හෝ සමාජ මූලය, නෛතික හා සමාජ තත්ත්වය, වයස, ආබාධිත බව, දේපල හිමිකම, උපත හෝ වෙනත් සමාන නිර්ණායකයන් අනුව විෂම ලෙස සලකා මේ ප්‍රතිපත්ති ක්‍රියාවේ නොයෙදිය යුතුය.

2. ළමයින්, විශේෂ හේතු නිසා එක්ව කැඳවා ගෙන යා නොහැකි කුඩා දරුවන්, ගැබිණි මව්වරුන්, කුඩා දරුවන් සිටින මව්වරුන්, කාන්තා ගෘහමූලිකයන්, ආබාධිත පුද්ගලයින්, වයස්ගත පුද්ගලයන් වැනි අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූ සමහර පුද්ගලයින්ට, ඔවුන්ගේ එකී විශේෂ තත්ත්වයන් මත අවශ්‍ය කරන ආරක්ෂාව හා සහාය ඔවුනට හිමි වෙයි. එමෙන්ම ඔවුන්ගේ විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගෙන කරනු ලබන සැලකිලි ඔවුනට හිමිවිය යුතුය.

## II කොටස

## අවතැන්වීමෙන් ආරක්ෂාවීම සම්බන්ධ ප්‍රතිපත්ති

### -ප්‍රතිපත්ති 5-

සියලුම ආණ්ඩු සහ ජාත්‍යන්තර ක්‍රියාකාරිකයන් සියලුම තත්ත්වයන්හිදී, මානවහිමිකම් සහ මානව හිතවාදී නීති ඇතුළුව ජාත්‍යන්තර නීතිය යටතේ ඔවුන්ගේ ඇති බැඳීම්වලට ගරු කළ යුතුවාක් මෙන්ම එසේ ගරු කරන බව සහතික කළ යුතුය. එමඟින් පුද්ගලයන් අවතැන්වීමේ තත්ත්වයන් වැළැක්වීමට සහ ඒවාට බාධා කිරීමට පුළුවන.

### -ප්‍රතිපත්ති 6-

1. ඔහුගේ හෝ ඇයගේ නිවසින්, නිත්‍ය වාසස්ථානය පිහිටි ප්‍රදේශයෙන් බලහත්කාර අවතැන් කරනු ලැබීමට එරෙහිව ආරක්ෂා වීමේ අයිතිය හැම මනුෂ්‍යයෙකුටම තිබිය යුතුය.

2. එබඳු බලහත්කාර අවතැන් කිරීම් තහනමට පහත සඳහන් අවතැන් කිරීම් ඇතුළත් වේ:

(අ) එය වර්ණභේදවාදී ප්‍රතිපත්ති පදනම් කර ගන්නා විට, ජාතිවාදය හෝ එවැනි ක්‍රියාවන් අරමුණු කරගන්නා විට හෝ අදාළ ජන කොට්ඨාශයේ ජාති, ආගම් හෝ වර්ණ සංයුතියෙහි ප්‍රතිඵලයක් ලෙස සිදුවන විට,

(ආ) පුරවැසියන් සම්බන්ධ වන ආරක්ෂක තත්ත්වයන් හෝ හමුදා අවශ්‍යතා අනුව අවශ්‍යයෙන්ම කළයුතු අවස්ථාවන් හැර, ආයුධ සන්නද්ධ අරගල අවස්ථාවන්හිදී,

(ඇ) බලහත්කාරයෙන් හෝ මහජන අවශ්‍යතා මැඩ පැවැත්වීමෙන්, සාධාරණීකරණය නොකරන ලද, මහපරිමාණයේ සංවර්ධන යෝජනා ක්‍රම ඇති කළ අවස්ථාවන්හි දී,

(ඈ) බලපෑමට ලක්වුවන්ගේ ආරක්ෂාව හා සෞඛ්‍යය හේතු උදෙසා ඔවුන්ගේ ඉවත්වයාම අවශ්‍ය කරන අවස්ථා හැර, ආපදා අවස්ථාවන්හි දී,

(ඉ) සාමූහික දඬුවමක් ලෙස එය ක්‍රියාත්මක කරන අවස්ථාවන්හි දී.

3. පවතින තත්ත්වයන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා අවතැන් වීම බලපැවැත්විය නොයුතුය.

## -ප්‍රතිපත්ති 7-

1. පුද්ගලයින් අවතැන්වීමට බලපාන්නාවූ කිසිදු තීරණයක් ගැනීමට පෙර අදාළ බලධාරීන් අවතැන්වීම සම්පූර්ණයෙන්ම මගහැරීම සඳහා අවශ්‍ය වන්නාවූ සියලු ශක්‍යතා විකල්පයන් සොයා බැලූ බවට සහතික විය යුතුය. එබඳු විකල්පයන් නොමැති අවස්ථාවන්හි දී, අවතැන්වීම අවම කිරීමට සහ එහි අහිතකර බලපෑම් අවම කිරීමට හැකි සියලුම පියවර ගත යුතුය.

2. එබඳු අවතැන්වීමක වගකීම භාරගන්නා බලධාරීන්, හැකි උපරිම ප්‍රායෝගික තත්ත්වයෙන්, අවතැන් වන පුද්ගලයන්ට යෝග්‍ය වාසස්ථාන සපයා දිය යුතුය. එබඳු අවතැන් වූ පුද්ගලයන්ට සතුටුදායක තත්ත්වයක ආරක්ෂාව, පෝෂණය, සෞඛ්‍යය හා සනීපාරක්ෂාව සැපයිය යුතු අතර, එකම පවුලේ සාමාජිකයන් ඔවුනොවුන්ගෙන් වෙන් නොකළ යුතුය.



3. ආයුධ සන්නද්ධ අරගල හෝ ව්‍යසන තත්ත්වයන් ඇති හදිසි අවස්ථාවන්හි හැර අනෙකුත් අවස්ථාවන්හි දී අවතැන්වීම් සිදුවන විට පහත සඳහන් දේවල් සහතික කළ යුතුය:

(අ) නීතියෙන් බලය ලැබූ රාජ්‍ය බලාධිකාරියක් මගින් එබඳු පියවර ගැනීමට පෙර විශේෂිත තීරණයක් ගත යුතුය.

(ආ) ඔවුන්ගේ අවතැන්වීමේ හේතු සහ ක්‍රියාමාර්ගය පිළිබඳ සියලු තොරතුරු අවතැන් වන පුද්ගලයින්ට ලබාදීමට ප්‍රමාණවත් පියවර ගත යුතු අතර, අදාළ වන අවස්ථාවන්හි දී, වන්දි සහ නැවත පදිංචිකරවීම පිළිබඳ තොරතුරු ලබා දිය යුතුය.

(ඇ) අවතැන්වීමට නියමිත පුද්ගලයන්ගෙන්, නිදහස් සහ තත්ත්වය අවබෝධ කොටගෙන කෙරෙන එකඟතාව ලබා ගත යුතුය.

(ඈ) අදාළ බලධාරීන්, අවතැන්වූවන්ගේ නැවත පදිංචිකරවීම සැලසුම් කිරීම සහ කළමනාකරණයේදී එසේ අවතැන් වූ පුද්ගලයින්, විශේෂයෙන්ම කාන්තාවන් සම්බන්ධ කරවා ගැනීමට උත්සාහ ගත යුතුය.

(ඉ) නීතිය ක්‍රියාත්මක කිරීමේ පියවර අවශ්‍ය වන අවස්ථාවන්හිදී, කාර්යක්ෂම නීති බලධාරීන් විසින් ඒවා කළ යුතුය.

(ඊ) යෝග්‍ය නීති බලධාරීන්ගේ එබඳු තීරණ සමාලෝචනය කිරීම ඇතුළු, අර්ථවත් පිළියම් යෙදීමේ අයිතිය ගරු කළ යුතුය.

## -ප්‍රතිපත්ති 8-

අවතැන් කිරීම, එයට ලක්වන්නන්ගේ ජීවිත, ගෞරවය, නිදහස සහ ආරක්ෂාව පිළිබඳ අයිතීන් උල්ලංඝනය වන ආකාරයෙන් සිදු නොකළ යුතුය.

## -ප්‍රතිපත්ති 9-

ආදිවාසීන්, සුළු ජාතීන්, ගොවීන්, එඬේරුන් හා සිය භූමිවලට විශේෂ බැඳීමක් හා ඒවා මත යැපීමක් ඇති අනෙකුත් කණ්ඩායම්වල අවතැන් කිරීම්වලින් ඔවුන් ආරක්ෂා කිරීමට රජයන්ට විශේෂ බැඳීමක් ඇත.

## III කොටස

## අවතැන් වීමේ කාලය තුළදී ආරක්ෂාව සඳහා වන ප්‍රතිපත්ති

### -ප්‍රතිපත්ති 10-

1. සෑම මනුෂ්‍යයකුටම නීතියෙන් ආරක්ෂා කරනු ලබන, ජීවිතය පිළිබඳ ගෛසර්ගික අයිතිය ඇත. කිසිවෙකුට බලහත්කාරයෙන් ඔහුගේ හෝ ඇයගේ ජීවිතය තොර කළ නොහැකිය. අභ්‍යන්තර අවතැන් කිරීම්වලට ලක්වූ පුද්ගලයින් පහත සඳහන් දේවලින් ආරක්ෂා කළ යුතුය.

    (අ) සමූලඝාතනය,

    (ආ) මිනීමැරුම,

    (ඇ) හේතු නොදක්වා සහ බලහත්කාර ලෙස කරනු ලබන මරණයට පත්කිරීම් සහ

    (ඈ) පැහැරගෙන යාම හෝ නොදන්වා සිරකර තබා ගැනීම, තර්ජනය කිරීම හෝ මරණය සිදු කිරීම ඇතුළත් බලහත්කාර අතුරුදහන් කිරීම්

    තර්ජනය කිරීම් සහ ඉහත සඳහන් කළ ක්‍රියාවන්ගෙන් කිසිවක් සඳහා පෙළඹවීම් සම්පූර්ණයෙන් තහනම් කළ යුතුය.

2. තවදුරටත් යුද්ධයක හෝ සටනක යෙදී නොසිටින අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන්ට එරෙහි සියලුම ආකාරයේ හිංසාකාරී ක්‍රියාවන් හා පහරදීම් තහනම් කළ යුතුය. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්, විශේෂයෙන් පහත සඳහන් ක්‍රියාවලින් ආරක්ෂා කළ යුතුය.

    (අ) සෘජු සහ වග විභාගයක් නැති පහරදීම් සහ හිංසාකාරී ක්‍රියාවන්,

    (ආ) සටන් කිරීමේ ක්‍රමයක් ලෙස නිරාහාරව තැබීම,

    (ඇ) පහරදීම් හෝ ආරක්ෂාවීම් සඳහා හමුදා කටයුතුවලට වාසිදායක ලෙස හෝ බාධා කිරීම සඳහා ඔවුන් හමුදා පලිහක් ලෙස යොදා ගැනීම,



    (ඈ) ඔවුන්ගේ කඳවුරු හෝ ජනාවාසවලට පහරදීම, සහ

    (ඉ) ඔවුන්ට එරෙහිව බිම්බෝම්බ භාවිතය

### -ප්‍රතිපත්ති 11-

1. සෑම මනුෂ්‍යයාටම ගෞරවය සහ ශාරීරික, මානසික හා සදාචාරාත්මක සම්පූර්ණ බව ලැබීමේ අයිතිය ඇත.

2. ඔවුන්ගේ නිදහස සීමා කර ඇතද නැතද, අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූ පුද්ගලයන්, විශේෂයෙන් පහත සඳහන් දේවලින් ආරක්ෂා කළ යුතුය.

    (අ) දූෂණය, අංග ඡේදනය, බලවත් වධහිංසා, අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙලෙසන ක්‍රියාවන් හෝ දඬුවම් සහ පුද්ගලික ගෞරවය කෙලෙසන අනෙකුත් සාහසික ක්‍රියාවන්, ලිංග භේදය පදනම්කරගත් හිංසාවන්, වෛශ්‍යා වෘත්තියේ බලහත්කාරයෙන් යෙදවීම හෝ කවරාකාර වූ හෝ අසභ්‍ය ක්‍රියාවන් ඇතුළත් පහරදීම්,

    (ආ) වහල්භාවය හෝ නූතන ක්‍රමයේ වහල් භාවය, විවාහය සඳහා විකිණීම, ලිංගික සූරාකෑම, හෝ ළමා ශ්‍රමය බලහත්කාරයෙන් ලබා ගැනීම, සහ

    (ඇ) අභ්‍යන්තර අවතැන් වූවන් අතර භීතිය පතුරුවා හැරීමේ අදහසින් කරන හිංසාකාරී ක්‍රියාවන්

ඉහතින් සඳහන් කළ ක්‍රියාවන්ගෙන් කවරක් හෝ කිරීමට තර්ජනය කිරීම හා අනුබල දීම තහනම් කළ යුතුය.

### -ප්‍රතිපත්ති 12-

1. පුද්ගල නිදහස සහ ආරක්ෂාව පිළිබඳ අයිතිය සෑම මිනිසාටම ඇත. බලහත්කාර අත්අඩංගුවට ගැනීමකට හෝ රඳවා තැබීමකට කිසිවකු ලක් නොවිය යුතුය.

2. අභ්‍යන්තර අවතැන්වීමට ලක්ව සිටින පුද්ගලයන්ගේ මේ අයිතිවාසිකම් ක්‍රියාවෙහි යෙදවීම සඳහා ඔවුන් කඳවුරක සිර කිරීම හෝ සිරබාරයේ

තබා ගැනීම නොකළ යුතුය. සුවිශේෂ තත්ත්වයන් යටතේ එබඳු සිරකර තැබීමක් හෝ සීමා කිරීමක් අවශ්‍ය වන්නේ නම්, එය එසේ අවශ්‍ය වන කාලසීමාවට වඩා දීර්ඝ නොවිය යුතුය.

3. ඔවුන්ගේ අවතැන්වීම හේතු කොටගෙන කරනු ලබන අත්අඩංගුවට ගැනීමකින් හෝ රඳවා තැබීමකින්, අවතැන් වූවන් ආරක්ෂා කළ යුතුය.

4. කවර කරුණක් නිසා හෝ අවතැන් වූවන් ප්‍රාණ ඇපකරුවන් ලෙස නොගත යුතුය.

## -ප්‍රතිපත්ති 13-

1. කිසිම කරුණක් නිසා හෝ අවතැන් වූ ළමයින්ට සටන්වලට සහභාගීවීමට අවසර නොදෙන අතර, එසේ බඳවා ගැනීම නොකළ යුතුය.

2. ඔවුන්ගේ අවතැන් වීම හේතු කොටගෙන, කිසිදු සන්නද්ධ පිරිසකට හෝ කණ්ඩායමකට හෝ බඳවාගැනීමේ විෂමචාර ක්‍රියාවන්ගෙන් අවතැන්වූවන් ආරක්ෂා කළ යුතුය. විශේෂයෙන්ම කවර වූ හෝ රුදුරු, අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙලෙසන තත්ත්වයන්ට බලකෙරෙන යටත්වීම සහ යටත් නොවන තත්ත්වයන්හි දී සේවයට බඳවා ගැනීමෙන් දඬුවම් කිරීම යනාදිය සියලු ආකාරයෙන්ම තහනම් කළ යුතුය.

## -ප්‍රතිපත්ති 14-

1. සෑම අභ්‍යන්තර අවතැන්වූවෙකුටම එහා මෙහා යාමේ අයිතිය හා ඔහුගේ හෝ ඇගේ වාසස්ථානය තෝරා ගැනීමේ අයිතිය ඇත.

2. විශේෂයෙන්ම, අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට කඳවුරුවලින් හා අනෙකුත් ජනාවාසවලින් පිටත නිදහසේ යාමේ සහ ඊමේ අයිතිය ඇත.

## -ප්‍රතිපත්ති 15 -

අභ්‍යන්තරිකව අවතැන් වූවන්ට පහත සඳහන් අයිතීන් ඇත.

(අ) රටෙහි වෙනත් ප්‍රදේශයක ආරක්ෂාව සොයා යාමේ අයිතිය,

(ආ) සිය රට හැරයාමේ අයිතිය,



(ඇ) වෙනත් රටක සරණාගත බව ලැබීමේ අයිතිය, හා

(ඈ) ඔවුන්ගේ ජීවිතය, ආරක්ෂාව, නිදහස සහ / හෝ සෞඛ්‍යයට තර්ජනයක් වන ලෙසින් කිසියම් ස්ථානයකට නැවත එන ලෙස බලකිරීමට එරෙහි වීමේ අයිතිය.

## -ප්‍රතිපත්ති 16-

1. සියලුම අභ්‍යන්තර අවතැන්වූවන්ට තමන්ගේ අතුරුදහන් වූ ඥාතීන් සිටින්නේ කොහිද යන්න හා ඔවුන්ගේ ඉරණම පිළිබඳ දැන ගැනීමට අයිතිය ඇත.

2. අතුරුදහන් වූ ලෙස වාර්තා වූ, අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ගේ ඉරණම සහ ඔවුන් සිටින්නේ කොහේද යන්න සොයා ගැනීමට අදාළ බලධාරීන් සියලු උත්සාහයන් ගත යුතුය. මෙම කාර්යයන්හි දී අදාළ බලධාරීන්, අදාළ ජාත්‍යන්තර සංවිධාන සමග එක්ව කටයුතු කළ මනාය. ඔවුන්ගේ සමීපතම ඥාතියාට පරීක්ෂණවල ප්‍රගතිය දන්වා සිටිය යුතු අතර, කිසියම් ප්‍රතිඵලයක් ඇතොත් ඔවුන්ට දැනුම් දිය යුතුය.

3. අදාළ බලධාරීන් විපතට පත්වූවන්ගේ මළ සිරුරු හඳුනාගැනීමටත් එවා එකතු කර ගැනීමටත් සියලු උත්සාහයන් ගත යුතුය. ඒවා පැහැරගෙන යාම හෝ අංග ඡේදනය කිරීමෙන් වැළැක්විය යුතු අතර, එම ප්‍රාණය නිරුද්ධ සිරුරු ළඟම ඥාතියාට අවශ්‍ය කටයුතු සඳහා භාර දිය යුතුය. නොඑසේ නම් ගෞරව සම්ප්‍රයුක්ත ලෙස ඒවායේ අවසාන කටයුතු කළ යුතුය.

4. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන්ගේ සොහොන් බිම් ආරක්ෂා කළ යුතු අතර සෑම විටම ඒවාට ගරු කළ යුතුය. සිය ව්‍යසනයට පත් ඥාතීන්ගේ සොහොන් බිම්වලට යාමට අවතැන් වූවන්ට අයිතිය ඇත.

## -ප්‍රතිපත්ති 17-

1. සෑම මිනිසෙකුටම, ඔහුගේ හෝ ඇගේ පවුල් ජීවිතයට ගරු කිරීමේ අයිතිය ඇත.

2. අභ්‍යන්තර ලෙස අවතැන්වීමට ලක්වූ පුද්ගලයින්ගේ මේ අයිතිය සහතික කිරීම උදෙසා, එක්ව සිටීමට අපේක්ෂා කරන පවුලේ සාමාජිකයන්ට එසේ අවසරය දිය යුතුය.

3. අවතැන්වීම නිසා වෙන් කරන ලද පවුල්වලට, හැකිතාක් ඉක්මනින් නැවත එකතු වීමට ඉඩ සැලසිය යුතුය. විශේෂයෙන්ම දරුවන් සම්බන්ධ වන විට, එසේ වෙන්වූ පවුල්වල අය එක් කිරීම සඳහා සියලුම යෝග්‍ය පියවරයන් ගත යුතුය. වගකිවයුතු බලධාරීන් පවුලේ සාමාජිකයන්ගේ විමසීම්වලට ප්‍රතිචාර දැක්විය යුතුය. පවුල් නැවත එක්කිරීමේ කාර්යයෙහි නියැලී සිටින මානවහිතවාදී සංවිධානයන්හි වැඩකටයුතු දිරිමත් කිරීමටත්, එවාට සහාය දීමටත් වගකිව යුතු ආයතන කටයුතු කළ යුතුය.

4. සිරකර තැබීමෙන් හෝ රඳවා තැබීමෙන් සීමා කරන ලද පෞද්ගලික නිදහසක් ඇති අභ්‍යන්තරව අවතැන් වූ පවුල්වල සාමාජිකයන්ට පවුලේ අය සමඟ එක්ව ජීවත්වීමේ අයිතිය තිබිය යුතුය.

## -ප්‍රතිපත්ති 18-

1. සියලුම අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයින්ට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් තබා ගැනීමේ අයිතිය ඇත.

2. අවම වශයෙන්, අවස්ථාවන් පිළිබඳ නොසලකා හැර, විශම සැලකිමකින් තොරව නිසි බලධාරීන් විසින් අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට පහත සඳහන් දේවලට පහසු පිවිසුම් සහතික කළ යුතුය.

   (අ) අත්‍යවශ්‍ය ආහාර හා බීමට යෝග්‍ය ජලය

   (ආ) මූලික ඉඳුම් හිටුම් හා නිවාස පහසුකම්

   (ඇ) යෝග්‍ය ඇඳුම් පැළඳුම්, හා

   (ඈ) අත්‍යවශ්‍ය වෛද්‍ය සේවා සහ සනීපාරක්ෂක පහසුකම්

3. මෙම මූලික සැපයුම් සැලසුම් කිරීමේදී හා බෙදා හැරීමේදී සම්පූර්ණ කාන්තා නියෝජනය සහතික කිරීමට අවශ්‍ය විශේෂ ප්‍රයත්නයන් දැරිය යුතුය.

## -ප්‍රතිපත්ති 19-

1. සියලුම තුවාල ලැබූ හෝ රෝගී වූ, අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින්ට මෙන්ම, ආබාධිත පුද්ගලයින්ට වෛද්‍ය හේතු හැර අනෙකුත් වෙනස්කම් කිසිවෙක් සැලකිල්ලට නොගෙන, ප්‍රමාදයකින් තොරව, හැකි උපරිම



ප්‍රායෝගික මට්ටමින්, ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර හා අවධානය ලබා දිය යුතුය. අවශ්‍යතාව පැන නැඟුණු කල්හි, අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූවන්ට ආධ්‍යාත්මික හා සමාජ සේවා ලැබීමට හැකියාව තිබිය යුතුය.

2. කාන්තාවන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මෙහිදී නාරි සෞඛ්‍ය පහසුකම් සලසන්නවුන් හා සේවාවන්ගේ සහාය ලැබීමට කාන්තාවන්ට හැකිවිය යුතුය. උත්පාදක සෞඛ්‍ය පහසුකම්, ලිංගික සහ අනෙකුත් අපචාරයන්ට ගොදුරු වූවන්ට යෝග්‍ය උපදේශක සේවාවන් ලබාදීමටද කටයුතු කළ යුතුය.

3. අභ්‍යන්තර අවතැන්වීම්වලට ලක්වූ පුද්ගලයන් අතර, ඒඩ්ස් ඇතුළු, ස්පර්ශයෙන් බෝවන රෝග හා බෝවන රෝගවලින් වැළකී සිටීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

## -ප්‍රතිපත්ති 20-

1. සෑම මනුෂ්‍යයකුටම, නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස සෑම තැනකදීම පිළිගනු ලැබීමට අයිතිය ඇත්තේ ය.

2. අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූවන්ට, එම අයිතිය සහතික කිරීම සඳහා, අදාල බලධිකාරීන් විසින්, ඔවුන්ගේ එකී නෛතික අයිතිය භුක්ති විඳිනු ලැබීමට අවශ්‍ය සියලු ලියකියවිලි එනම් විදේශ ගමන් බලපත්‍ර, පෞද්ගලික හඳුනාගැනීමේ ලියවිලි, උප්පැන්න සහතික සහ විවාහ සහතික යනාදිය ලබා දීමට කටයුතු කළ යුතුය. විශේෂයෙන්ම, අවතැන්වීම නිසා නැතිවූ ලියකියවිලි වෙනුවෙන් අළුත් ලියකියවිලි හෝ එම ලියකියවිලි නැවත සැපයීමට හෝ අදාල බලධාරීන් අවශ්‍ය කටයුතු කළ යුතුය. මෙහිදී ඔවුන්ගේ පුරුදු වාස භූමි ප්‍රදේශවලින් අවශ්‍ය ලියකියවිලි සපයාගෙන එන ලෙස දක්වමින් අයුතු කොන්දේසි නොපැනවිය යුතුය.

3. අවශ්‍ය එබඳු ලියකියවිලි ලබා ගැනීමට ගැහැණුන්ට හා පිරිමින්ට සමාන අයිතිය ඇත. එමෙන්ම තමන්ගේ නම්වලින්ම එම ලියකියවිලි ලබා ගැනීමටද ඔවුන්ට අයිතිය ඇත.

## -ප්‍රතිපත්ති 21-

1. කිසිවෙකුට බලහත්කාරයෙන්, කිසිවෙකුට අයත් දේපල සහ සන්තකයෙහි ඇති දේ ඉවත්කළ නොහැකිය.

2. අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන්ගේ දේපල සහ ඔවුන් සන්තකයෙහි ඇති දේ සියලු ආකාරයෙන්ම ආරක්ෂා කළ යුතුය. විශේෂයෙන්ම පහත සඳහන් ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කර දිය යුතුය.

(අ) කොල්ලකෑම

(ආ) ඍජු හෝ විනාකූල පහරදීම් හෝ අනෙකුත් හිංසාකාර ක්‍රියාවන්

(ඇ) හමුදා ක්‍රියාදාමයන්හි දී ආරක්ෂාව සඳහා යොදා ගැනීම

(ඈ) පළිගැනීමට යොදා ගැනීම

(ඉ) සමූහ දඬුවමක් දීම සඳහා විනාශ කිරීම

3. අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූවන්ගේ දේපල හා සන්තක දේ විනාශ කිරීම සහ බලහත්කාර හා නීත්‍යානුකූල නොවන ලෙස අයිතිකර ගැනීම, සන්තකයට ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීමෙන් වැළැක්විය යුතුය.

## -ප්‍රතිපත්ති 22-

1. අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූවන්ට, ඔවුන් කඳවුරුවල ජීවත් වුවද, නොවුවද, ඔවුන්ගේ අවතැන්වීම හේතුකොටගෙන විෂම සැලකීමට ලක් නොවිය යුතු අතර ඔවුන්ට පහත සඳහන් අයිතීන් ලැබිය යුතුය.

(අ) සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස, ආගම හා විශ්වාසය පිළිබඳ නිදහස, අදහස් හා හැඟීම් පළ කිරීමේ නිදහස

(ආ) නිදහසේ රැකියා අවස්ථා සොයා යාමට ඇති අයිතිය හා ආර්ථික ක්‍රියාවන්ට සහභාගි වීමේ අයිතිය

(ඇ) ප්‍රජා කටයුතුවලට සමාන ලෙස සහභාගි වීමේ හා එවාට නිදහසේ සම්බන්ධ වීමේ අයිතිය.

(ඈ) රජයේ කටයුතු වලට සහ පොදු කටයුතුවලට සහභාගි වීමේ සහ ඡන්දය දීමේ අයිතිය. මෙම අයිතිය භුක්තිවිඳීමට අවශ්‍ය ස්ථානයන්ට ප්‍රවිශ්ට වීමේ අයිතියද මෙයට ඇතුළත් වේ

(ඉ) ඔවුන්ට තේරුම්ගත හැකි භාෂාවකින් අදහස් හුවමාරු කිරීමේ නිදහස



## -ප්‍රතිපත්ති 23-

1. සෑම මනුෂ්‍යයෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත.

2. අභ්‍යන්තර අවතැන්වූවන්ගේ මෙම අයිතිය ක්‍රියාවෙහි යෙදවීම සඳහා, අදාල බලධාරීන් විසින් එබඳු පුද්ගලයන්, විශේෂයෙන් අවතැන් වූ දරුවන්ට, ප්‍රාථමික මට්ටමේ නිදහස් අධ්‍යාපනය ලබාදිය යුතු අතර, එය අනිවාර්ය කළ යුතුය.

3. අධ්‍යාපන වැඩසටහන්වල ස්ත්‍රී හා ගැහැණු ළමයින්ගේ සමාන හා සම්පූර්ණ සහභාගිත්වය සහතික කිරීමට විශේෂ ප්‍රයත්නයන් දැරිය යුතුය.

4. අභ්‍යන්තර අවතැන් වීමට ලක්වූවන්ට අධ්‍යාපන හා පුහුණු පහසුකම් ලබා දිය යුතුය. විශේෂයෙන්ම යොවුනයින්ට සහ කාන්තාවන්ට කඳවුරුවල වත් වුවද, නැතද, සුදුසු අවස්ථාව උදා වූ වහාම එම පහසුකම් ලබාදිය යුතුය.

# IV කොටස. මානව හිතවාදී සහාය සම්බන්ධ ප්‍රතිපත්ති

## -ප්‍රතිපත්ති 24-

1. සියලුම මානව හිතවාදී සහායන් ලබාදිය යුත්තේ විෂම සැලකීමකින් තොරව, අපක්ෂපාතීව හා මානව හිතවාදී ප්‍රතිපත්තිවලට අනුකූල වනසේ ය.

2. විශේෂයෙන්ම දේශපාලන හා හමුදාමය හේතු නිසා, අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්ට දෙනු ලබන මානව හිතවාදී සහයෝගය වෙනත් අතකට යොමු නොකළ යුතුය.

## -ප්‍රතිපත්ති 25-

1. අභ්‍යන්තර අවතැන්වූවන්ට මානව හිතවාදී සහයෝගය ලබාදීමේ මූලික වගකීම හා යුතුකම රඳාපවතින්නේ ජාතික අධිකාරීන් වෙතය.

2 අභ්‍යන්තරිකව අවතැන්වූවන්ට සහාය දීම සඳහා සිය සේවාවන් ප්‍රදානය කිරීමට ජාත්‍යන්තර මානව හිතවාදී සංවිධානයන්ට සහ අනෙකුත් යෝග්‍ය ක්‍රියාකාරිකයන්ට අයිතිය ඇත. එවැනි ප්‍රදානයක් සතුරු ක්‍රියාවක් හෝ රජයේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමක් හෝ ලෙස නොසැලකිය යුතු අතර, එවැන්නක් සද්භාවයෙන් කරනු ලබන්නක් සේ සැලකිය යුතුය. අදාළ බලධාරීන්ට මානව හිතවාදී සහාය ලබා දීමට නොහැකි වන විට හා එසේ ලබා දීමට කැමැත්තක් නැති විට, එසේ සහාය දීමට අනෙකුත් සංවිධානවලට අවසර නොදී සිටීම නොකළ යුතුය.

3 අදාළ සියලු බලාධිකාරීන් විසින් මානව හිතවාදී සහාය දෙන්නවුන්ට සහ එබඳු කාර්යන්හි යෙදී සිටින අයට නිදහසේ යාමේ සහ ඒමේ අයිතිය දිය යුතු අතර, අවතැන් වූවන් කරා යාමට බාධා නොකළ යුතුය.

## -ප්‍රතිපත්ති 26-

මානව හිතවාදී සහාය කටයුතුවල යෙදී සිටිය පුද්ගලයන්ට, ඔවුන්ගේ ප්‍රවාහන හා සැපයුම්වලට ගරු කළ යුතු අතර ආරක්ෂා කළ යුතුය. එවා පහරදීමට හෝ හිංසාකාරී ක්‍රියාවන්ට ලක් නොවිය යුතුය.

## -ප්‍රතිපත්ති 27-

1. ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සහ අනෙකුත් යෝග්‍ය ක්‍රියාකාරිකයන් ආධාර සපයන කල්හි ඔවුන් අවතැන් වූවන්ගේ මානව අයිතිවාසිකම් හා ආරක්ෂක අවශ්‍යතා පිළිබඳව නිසි සැලකිල්ල දැක්විය යුතුය. මේ සම්බන්ධ නිසි පියවර ගත යුතුය. එසේ කිරීමෙන්, මෙම සංවිධාන සහ ක්‍රියාකාරිකයන් අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා චර්යා ධර්මවලට ගරු කළ යුතුය.

2. ඉහතින් සඳහන් වූ ඡේදය, රාජ්‍යයන් එකී ආධාර විසින් ඉල්ලා සිට විටකදී හා එම සංවිධාන විසින් එකී සේවාවන් ප්‍රදානය කළ විටකදී, මෙම අරමුණ සඳහා බලය ලැබී තිබෙන ජාත්‍යන්තර සංවිධානයන්හි වගකීම් ආරක්ෂා කරනු ලැබීමට අගතියක් නොකරන්නේ ය.



# V කොටස. ආපසු පැමිණීම, නැවත පදිංචි වීම සහ නැවත එක්වීම

## -ප්‍රතිපත්ති 28-

1. අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූවන්ට ස්වේච්ඡාවෙන්, ආරක්ෂා සහිතව, ගෞරවනීය ලෙස, සිය නිවෙස්වලට හා පුරුදු වාසභූමිවලට පැමිණීමට හෝ රටේ වෙනත් ප්‍රදේශයක ස්වේච්ඡාවෙන් නැවත පදිංචිවීමට හැකි තත්ත්වය ස්ථාපනය කිරීමේ වගකීම සහ මූලික යුතුකම, එමෙන්ම, එයට අවශ්‍ය පසුබිම සැකසීම, නිසි බලධාරීන් වෙත පැවරේ.

2. අවතැන් වූවන්ගේ ආපසු පැමිණීම, නැවත පදිංචිය හා නැවත එක්වීම සැලසුම් කිරීමේදී හා කළමනාකරණයේදී එසේ අවතැන් වූ අයගේ සම්පූර්ණ සහභාගිත්වය සහතික කිරීමට විශේෂ ප්‍රයත්නයක් දැරිය යුතුය.

## -ප්‍රතිපත්තිය 29-

1. ඔවුන් අවතැන් වූවන් වීමේ හේතුවෙන් රටේ වෙනත් ප්‍රදේශයක නැවත පදිංචි වූ පුද්ගලයින්ට හෝ සිය පුරුදු වාසභූමිවල නැවත පදිංචියට පැමිණි පුද්ගලයින්ට හෝ විෂම ලෙස නොසැලකිය යුතුය. පොදු කටයුතුවල සියලුම මට්ටම්වලදී සම්පූර්ණයෙන් හා සමාන ලෙස නියෝජනය වීමේ අයිතිය හා පොදු සේවාවන්ට සමාන ලෙස පිවිසීමේ අයිතිය ඔවුන්ට ලැබෙනවා ඇත.

2. නැවත ආපසු පැමිණි අයට සහාය දීමේ වගකීම සහ / හෝ හැකි ප්‍රමාණයකට, එසේ නැවත පදිංචි වූ අවතැන් වූ පුද්ගලයන්ට යථා තත්ත්වයට පත්වීමට සහාය දීමේ වගකීම, අවතැන් වීමේ හේතුවෙන් අයිතිය අහිමි වූ ඔවුන්ගේ දේපල හෝ ඔවුන් එසේ අතහැරගිය දේපලවල හා සන්තක දෙයෙහි අයිතිය නැවත ලබා ගැනීමට සහාය වීමේ යුතුකම හා වගකීම නිසි බලධාරීන්ට ඇත. එබඳු සන්තක දෙයක් හා දේපලක් නැවත ලබා ගැනීමට නොහැකි වූ අවස්ථාවකදී, ඒ වෙනුවෙන් යෝග්‍ය වන්නාවූ වන්දියක් හෝ වන්දියක ස්වරූපයේ අන් කිසි දෙයක් අවතැන් වූවන්ට ලබා දීමට නිසි බලධාරීන් සහාය දිය යුතුය.

## -ප්‍රතිපත්ති 30-

සියලුම බලධාරීන්, ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවලට සහ අනෙකුත් යෝග්‍ය ක්‍රියාකාරීනයන්ට, අදාළ බලයට අනුකූලව, ඔවුන්ගේ ආපසු පැමිණීම හෝ නැවත පදිංචිවීම සහ නැවත එකතු වීම යන කාර්යන්හිදී අවතැන්වූවන්ට සහාය දීමේ ඉක්මනින් සහ බාධා රහිතව, ඔවුන් වෙත ළඟා වීමට හැකි තත්ත්වය උදාකර දිය යුතුය.



## හැඳින්වීමේ සටහන

## අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයින් පිළිබඳ මහ ලේකම්ගේ නියෝජිතවරයා විසිනි

හිංසාකාර යුද්ධ, මානව හිමිකම් දැඩිලෙස උල්ලංඝනය කිරීම සහ අනෙකුත් ඛිහිපුණු සිද්ධීන් නිසා බලහත්කාරයෙන් සිය වාසස්ථානවලින් පලවා හරින ලද, එහෙත් තවදුරටත් සිය රටවල දේශසීමාවන් තුළ රැඳී සිටින පුද්ගලයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඉතා උත්කෘෂ්ට මෙහෙයීමක් ඉටු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවට පැවරී තිබේ. හැමවිටම වාගේ ඔවුන්ට බරපතල දුෂ්කරතාවලට, අමාරුකම්වලට හා වෙනත් ආකාර සැලකිලිවලට ගොදුරු වීමට සිදුව තිබේ. අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති වර්ධනය කරනු ලැබුවේ මේ අභියෝගය ජයගනු සඳහාය.

මෙම ප්‍රතිපත්ති, අයිතිවාසිකම් හඳුනාගන්නා අතර, අවතැන්වීමේ සියලු අදියරයන්හි අභ්‍යන්තර අවතැන්වීම් සඳහා අදාළ ආරක්ෂාව සහතික කරයි. බලහත්කාර අවතැන්කිරීමට එරෙහි ආරක්ෂාව එමගින් සැලසෙයි. එමගින් සහයෝගයෙන්, ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රමාණවත් ආවරණයක් අභ්‍යන්තර අවතැන්වූවන්ට ලැබෙන්නේද, යන්න විභාග කළෙමි. එමෙන්ම Compilation and Analysis of Legal Norms (E/Cn.4/1996/52/Add 2), සම්පාදනය කළෙමි. පවත්නා නීතිය අවතැන් වූවන්ට ප්‍රමාණවත් ආවරණයක් සැලසූ බව අධ්‍යයනයෙන් සොයා ගත් නමුදු වැදගත් ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ ආරක්ෂාව සහ සහාය සඳහා ප්‍රමාණවත් පදනමක් දැමීමට එය අසමත් වී ඇති බව පෙනී ගියේ ය. දෙවනුව, කොමිසම සහ මහ සභාව, අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් සුදුසු ක්‍රියාකාරී වැඩසටහනක් සකස් කරන ලෙස මගෙන් ඉල්ලා සිටියේ ය. මෙය පවත්නා තත්ත්වය නැවත සකස් කිරීමට සහ අඳුරු පැති පැහැදිලි කොට ගැනීමටත්, හිඩැස් පිරවීමටත් මග සැලසූ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සම්පාදනයට මග පෑදිය.

1998 දී මාර්ගෝපදේශ ප්‍රතිපත්ති මවිසින් කොමිසමට ඉදිරිපත් කළ පසු, එකී මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හා මහ ලේකම්වරයාගේ නියෝජිතයා ලෙස, අභ්‍යන්තර අවතැන්වීමට ලක්වූ පුද්ගලයින්ගේ අවශ්‍යතා හා සම්බන්ධ ක්‍රියාකාරකම් හා බලපෑ ක්‍රියාත්මක කෙරෙන ආණ්ඩු සහ අනෙකුත් ක්‍රියාකාරිකයන් සමග මා පවත්වාගෙන යනු ලබන සාකච්ඡා ප්‍රයෝජනයට ගැනීමේ මගේ අභිලාෂය සැලකිල්ලට ගෙන යෝජනාවක් සම්මත කරගත්තේ ය. කොමිසම අන්තර් ආයතනික ක්‍රියාකාරී කමිටුවේ තීරණයද සැලකිල්ලට ගන්නා ලදි. අන්තර් ආයතනික ක්‍රියාකාරී කමිටුව ප්‍රතිපත්ති පිළිගනු ලැබූ අතර, එහි සාමාජිකත්වයට,

ඔවුන්ගේ විධායක මණ්ඩලවලදී සහ කාර්ය මණ්ඩලවලදී, විශේෂයෙන්ම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලවලදී, එම ප්‍රතිපත්ති ප්‍රයෝජනයට ගන්නා ලෙසත්, අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් ඔවුන්ගේ ක්‍රියාකාරකම් අදාළ කරගන්නා ලෙසටත් දිරි ගන්වනු ලැබිණි.

අභ්‍යන්තර අවතැන් වූවන් සමග කරන කාර්යන්හි දී ආණ්ඩුවලට, අනෙකුත් බලධාරී ආයතනයන්ට, අන්තර් රාජ්‍ය සංවිධානවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට මේ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති වටිනා ප්‍රායෝගික අත්වැලක් සපයනු ඇත. ඒවා පුළුල් ලෙස ව්‍යාප්ත කර හරිනු ඇතැයිද ක්ෂේත්‍රයේදී ඒවාට ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක් ලැබෙනු ඇතැයිද යනු මගේ බලාපොරොත්තුවයි.